# 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 9(1)(ආ) වගන්තිය ප්‍රකාරව තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව විසින් නිකුත් කරනු ලැබූ මාර්ගෝපදේශන

- 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 9 වන වගන්තිය යටතේ සිදුකරනු ලබන සන්නිවේදනයන් අවශ්‍ය කරනුයේ ඇමරිකානු එක්සත් ජනපද ඩොලර් 100,000 ක් ඉක්මවන (විදේශ ආධාර ලබන ව්‍යාපෘති සම්බන්ධයෙන් වන විට) සහ ශ්‍රී ලංකා රුපියල් ලක්ෂ 500,000 ක් ඉක්මවන (දේශීය වශයෙන් ආධාර ලබන ව්‍යාපෘති සම්බන්ධයෙන් වන විට) ව්‍යාපෘති සඳහා පමණි. එසේ හෙයින් "යෝජිත ව්‍යාපෘතිය" හෝ ''ව්‍යාපෘති" යන යෙදුම්වලින් මෙතැන් පටන් අදහස් වන්නේ එකී අගයන් ඉක්මවන ව්‍යාපෘති වේ.

- මෙහි අඩංගු වන්නේ, සෙසු නීති,රීති හා මාර්ගෝපදේශනයන් හි අඩංගු වන දැනුම්දීම් හා හෙළිදරව් කිරීමේ අවශ්‍යතාවයන්ට අමතරව හෙළිදරව් කළ යුතු කරුණු පිළිබඳ අවශ්‍යතාවයන් වේ.

- 9 වන වගන්තියේ අභිප්‍රායයන් සඳහා "ව්‍යාපෘති" යන යෙදුමට, සියලුම ප්‍රාග්ධන වියදම් හෝ ප්‍රසම්පාදන කමිටුවලින් අනුමත කළ සියලුම ප්‍රසම්පාදන ක්‍රියාකාරකම් ඇතුළත් වන නමුත් පුනරාවර්තී වියදම් මෙයින් බැහැර වේ.

- 2016 අංක 12 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 9 වන වගන්තිය යටතේ නියම කරනු ලබන යෝජිත ව්‍යාපෘතියකට මුලපිරීමේඑකී දැනුම්දීම,රීතියක් වශයෙන්,එබඳු ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට අවම වශයෙන් මාස තුනකටවත් පෙරලබාදිය යුතු බව සලකන්න. එබඳු ව්‍යාපෘතියක් ව්‍යාතිරේකී අවස්ථාවක පවතින්නේ නම් පමණක්, එනම් හදිසි ව්‍යාපෘතියක් වන්නේ නම් පමණක් අමාත්‍යවරයෙකු හට එම දැනුම්දීම සතියකට පෙර ලබාදිය හැකිය. කෙසේ නමුත් හදිසි ව්‍යාපෘති සම්බන්ධයෙන් පවා, අමාත්‍යවරයා විසින් පහත දැක්වෙන කාරණා තොරතුරු කොමිෂන් සභාව වෙත ලිඛිතව දැනුම් දිය යුත්තේය.
  - අ) යෝජිත ව්‍යාපෘතිය හදිසියේ ක්‍රියාවට නැංවීමට හේතු
  - ආ) ඉහත කී හේතු සනාථ කරන සාක්ෂි.

- යෝජිත ව්‍යාපෘතියකට අදාළව මහජනයා වෙත හෝ එබඳු ව්‍යාපෘතියකින් බලපෑමට ලක්වන වෙනත් විශේෂ තැනැත්තන් සිටියි නම් ඔවුන් වෙත පහත දැක්වෙන තොරතුරු, පහත දැක්වෙන මාධ්‍යයන්ගෙන් හෙළිදරව් කළ යුතුය.
  - අ) අමාත්‍යාංශ වෙබ් අඩවියේ ඩිජිටල් ඉලෙක්ට්‍රොනික ආකෘතියකින් සිංහල හා දමිල මාධ්‍යයෙන්ද, හැකි නම් ඉංග්‍රීසි මාධ්‍යයෙන් ද
  - ආ) අමතරව, විශේෂිත ස්ථානවල ක්‍රියාත්මක කිරීමට නියමිත යෝජිත ව්‍යාපෘති සම්බන්ධයෙන් මහජනයාට පෙනෙන පරිදි, මෙහි දැක්වෙන 1 වන ඇමුණුමෙන් නියම කරන විස්තර පළ කරමින් එකී ව්‍යාපෘති වැඩබිම්වල එළිමහන් පුවරු (බිල්බෝඩ්) මහජනයාට පෙනෙන පරිදි නැංවිය යුතුය.
  - ඇ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන අදාළ ප්‍රදේශයන් හි අන්තර්ජාල ප්‍රවේශය සම්බන්ධයෙන් ගැටලුවක් පවතියි නම් මෙහි 1 වන ඇමුණුමේ දක්වා තිබෙන තොරතුරු,එකී ප්‍රදේශවල ජනතාව අතර, හැකිතාක් ප්‍රායෝගික ලෙසින් ග්‍රාම සේවා නිලධාරීවරුන්, ප්‍රාදේශීය ලේකම්වරුන් සහ දිස්ත්‍රික් බලධාරීන් සහ, අමාත්‍යවරයා සුදුසු යැයි සිතන වෙනත් ඕනෑම මාධ්‍යයක් හෝ ආකාරයකින් බෙදා හැරිය යුතුය.

# 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 9 වන වගන්තිය යටතේ යෝජිත ව්‍යාපෘතියක් සම්බන්ධව පළ කරනු ලබන දැන්වීම

දිනයඃ.........................................

අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව/ ආයතනයඃ ..................................................................................................

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ආයතනයඃ....................................................................................................................

## අ. යෝජිත ව්‍යාපෘතිය පිළිබඳ සවිස්තරාත්මක තොරතුරු

1. යෝජිත ව්‍යාපෘතියේ විස්තරඃ

2.ව්‍යාපෘතියේ ස්ථානගත වීම (ව්‍යාපෘති ක්‍රියාකාරකම් සිදුකරන ස්ථානය පළාත, දිස්ත්‍රික්කය, කොට්ඨාසය, ස්ථානය වශයෙන් දක්වන්න. මායිම පැහැදිලිව සීමා නිර්ණය කළ නොහැකි නම් අතිරේක විස්තර සපයන්න.)

3.ව්‍යාපෘතිය ආරම්භ වීමට යෝජිත දිනයඃ

4.ව්‍යාපෘතිය අවසන් වීමට යෝජිත දිනයඃ

## ආ. ව්‍යාපෘතියේ මූලකාරණය/තාර්කිකත්වය (සංවර්ධන ප්‍රතිඵල සඳහා කළමනාකරණ රාමුවක් ව්‍යාපෘතිය සඳහා සකස් කර තිබේ නම් එය ද හෙළිදරව් කරන්න)

5.ව්‍යාපෘතියේ අරමුණු/ඉලක්කඃ

6.ව්‍යාපෘතියේ අපේක්ෂිත ප්‍රතිඵල/ප්‍රතිලාභඃ

7.ඉලක්කගත අර්ථලාභියෝ/පරදු දරන්නෝඃ

8.යෝජිත ව්‍යාපෘතිය ක්‍රියාවට නැංවීම හේතුවෙන් කිසියම් පුරවැසියෙක් බලපෑමට ලක්වීමේ ඉඩක් තිබේද? (උදාහරණයක් වශයෙන්, ව්‍යාපෘතිය සඳහා පුද්ගලික දේපළ අත්පත් කර ගැනීම, ජීවනෝපායට බලපෑම් ඇතිවීම, හෝ කිසියම් තැනැත්තෙකුගේ අයිතිවාසිකම්වලට බලපෑමක් සිදුවේද?) ඔව්/නැත

9.ඔව් නම්, ඔවුන්ට ප්‍රමාණවත් දැනුම් දීමක් සිදු කර තිබේද සහ/හෝ ව්‍යාපෘතිය සම්බන්ධයෙන් ඔවුන්ගේ අදහස් විමසා තිබේද? ඔව්/නැත

10.නැත නම්, එම නොකර හැරීමට හේතු පැහැදිලි කරන්න.

11.බලපෑමට පත් පාර්ශවයන්ට වන්දි ගෙවීමට/හානිපූරණය කිරීමට ගෙන ඇති පියවර පිළිබඳ සවිස්තරාත්මක විස්තරයක් ලබාදෙන්න. වන්දි ලබාගැනීම සඳහා අයදුම්කිරීමට අදාළ ආයතනික වගකීම සම්බන්ධ විස්තර ලබාදෙන්න.

12.සාධාරණීකරණය (උදාඃ මූල්‍ය පිරිවැය වාසිය, ආර්ථික පිරිවැය වාසිය ආදිය):

## ඇ. ව්‍යාපෘති අයවැය සහ මූල්‍ය තොරතුරු

13.ව්‍යාපෘතියේ සම්පූර්ණ ඇස්තමේන්තුගත පිරිවැය

14.එකඟ වූ මිල ගණන් (මෙය, ගෙවීම සිදුකරන ව්‍යවහාර මුදල් ඒකකයෙන් මෙන්ම ශ්‍රී ලංකා රුපියල්වලින් ද දක්වන්න)

15.මුදල් ලැබෙන මූලාශ්‍රය (විදේශ/දේශීය/වෙනත්-උදාහරණයක් වශයෙන් පොදු පෞද්ගලික හවුල්කාරිත්වය)-ව්‍යාපෘතිය සඳහා මුදල් යෙදවීමට සම්බන්ධ විදේශීය හෝ දේශීය ආස්ථිති/ආයතන හඳුනා ගන්න.

16.යෝජිත ව්‍යාපෘතිය පොදු පුද්ගලික හවුල්කාරිත්වයන්ගේ පදනම යටතේ ක්‍රියාවට නැංවේ නම් ආණ්ඩුවසහ පුද්ගලික අංශ පාර්ශවය අතර පවතින එකඟතාවයේ ප්‍රධාන කොන්දේසි සහ නියමයන් සපයන්න. (කොටස් පිළිබඳ විස්තර, ලාභ බෙදෙන පදනම හා ආණ්ඩුවේ අධිකාරිය මත පුද්ගලික අංශ පාර්ශවයන්ට එකතු කර ගත හැකි ගාස්තු, බදු හෝ වෙනත් ආකාරවල ආදායම් පිළිබඳ විස්තර මෙයට ඇතුළත් විය යුතුය.)

17.යෝජිත ව්‍යාපෘතිය ක්‍රියාවට නැංවීම තුළ ශ්‍රී ලංකා රජයේ/ආණ්ඩුවේ වැය/වියදම් වශයෙන් කොන්ත්‍රාත්කරුට හෝ පුද්ගලික පාර්ශවයන්ට ලැබෙන අතිරේක වාසි/ලාභ සියල්ල ලැයිස්තුගත කරන්න. උදාහරණයක් වශයෙන් බදු විශ්‍රාම, බදු සහන, සහනදායී මිල ගණන්/මුදලකට ඉඩම් විකිණීම/සින්නක්කර ලබාදීම යනාදිය.

## ඈ. අත්‍යාවශ්‍ය නිෂ්කාෂණ

18.යෝජිත ව්‍යාපෘතිය ජාතික සැලසුම්කරණ/ආර්ථික සංවර්ධන කමිටුව/ කැබිනට් මණ්ඩලය/ආයෝජන මණ්ඩලය/පළාත් සභාව/ප්‍රාදේශීය සභාව/අදාළ පාලනාධිකාරිය යනාදී අදාළ අධිකාරියෙන් අනුමැතිය ලබාගත් දිනය සඳහන් කරන්න.

19.පහත දැක්වෙන කාර්යයන් ව්‍යාපෘතිය ක්‍රියාවට නැංවීමේදී අදාලවේද?
අ) ලංසු අගැයීම්: ඔව්/නැත
ආ) සාධ්‍යතා අධ්‍යයනය: ඔව්/නැත
ඇ) තාක්ෂණික අගැයීම්: ඔව්/නැත
ඈ) මූල්‍ය අගැයීම්: ඔව්/නැත

ඔව් නම් එම කාර්යයන් පිළිබඳ වාර්තාවන්ට අදාල දිනයන් ලබාදෙන්න. විශේෂයෙන්ම ප්‍රසම්පාදන කමිටු වාර්තා, ලංසු අගැයීම් කමිටු වාර්තා, තාක්ෂණික අගැයීම් කමිටු වාර්තා හෝ එවැනි වෙනත් වාර්තා තිබේ නම් ඒවායේ දිනයන් හා යොමු අංක ලබාදෙන්න.

20.භෞතික, ජීව විද්‍යාත්මක, සමාජ සංස්කෘතික හෝ සෞන්දර්යාත්මක අංශයන්ගෙන් සිදුවිය හැකි යම් පාරිසරික බලැමක් තිබේ නම් ඒවා විස්තර කරන්න.

21.අදාළ අවස්ථාවලදී පාරිසරික බලපෑම් තක්සේරුවක් ලබාගෙන තිබේද? ඔව්/නැත

22.ඔව් නම් පාරිසරික බලපෑම් තක්සේරුව සිදුකළ එකී ආයතනයේ/ආස්ථිතියේ විස්තරය, සහ වාර්තාවල/වාර්තාවේ දින(ය) දක්වන්න.

23.නැත නම් පාරිසරික බලපෑම් තක්සේරුවක් ලබානොගැනීමට හේතු දක්වන්න.

24.අවශ්‍ය අවස්ථාවලදී අදාළ නියාමන ආයතනවලින් අනුමැතීන් ලබාගෙන තිබේද? ඔව්/නැත

25.ඔව් නම්, එබඳු අනුමැතියක් ලබාගෙන තිබෙන ආයතන සහ දින කවරේද?

26.ඉදිරියේදී ලැබෙන්නට නියමිත අනුමැතීන් කවරේද?

## **ඉ. සැපයුම්කරු/විකිණුම්කරු/කොන්ත්‍රාත්කරු**

27.ව්‍යාපෘතිය ඉල්ලීමක් මත සිදුකරන ලද්දක්ද? නැතිද?

28.ඉල්ලීමක් මත සිදුකරන ව්‍යාපෘතියක් නොවේ නම්, ව්‍යාපෘතියේ යෝජකයා, ව්‍යාපෘති යෝජනාව සහ එම යෝජනාව සිදුකළ දිනය පිළිබඳ විස්තර දක්වන්න.

29.ඉල්ලීමක් මත සිදුකරන ව්‍යාපෘතියක් නොවන විටදී එබඳු ව්‍යාපෘති බාහිර මූලාශ සහිත නම්,

29.1. අරමුදල් සපයන්නාගේ නමඃ
29.2. මුදල් ලබාදීමේ කොන්දේසිඃ

30.ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට නියමිත සැපයුම්කරු/විකුණුම්කරු/කොන්ත්‍රාත්කරුගේ විස්තර දක්වන්න.

31.ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන්නේ කොන්ත්‍රාත් පදනම මතද? ඔව්/නැත

32.ඔව් නම් කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබේද? ඔව්/නැත

33. අ) ඔව් නම් ගිවිසුමට එළඹුණු දිනය?
ආ) නැත නම් ගිවිසුමට එළඹිය යුතුදිනය?

34.ව්‍යාපෘතිය සඳහා ලංසු ඉදිරිපත් කළ ලංසුකරුවන්ගේ සංඛ්‍යාවමෙන්ම අදාළ නම් සහ ඔවුන් සම්බන්ධ කර ගත හැකි විස්තරයක් ද සඳහන් කරන්න.

35. ඉහත දැක්වූ සියල්ල සම්බන්ධයෙන්, පොදු ජනතාවට ප්‍රවේශ විය හැකි, සාධාරණත්වයේ සහ විනිවිදභාවයේ පිළිගත් ප්‍රමිතීන් තහවුරු කරන යම් පැමිණිලි හසුරුවන යාන්ත්‍රණයක් වේ නම් එය දක්වන්න.

යම්කිසි වැඩිදුර විමසීම් හෝ පැහැදිලිකර ගැනීම් අවශ්‍ය නම් .......................................................... ව්‍යාපෘතිය පිළිබඳ මහජනයාට විස්තර සැපයීම භාරව කටයුතු කරන නිලධාරියාගේ නිලය), දුරකථන අංකය/විද්‍යුත් ලිපිනය..........................................................................................................

## ඇමුණුම 1

## ව්‍යාපෘති ක්ෂේත්‍රයේ එළිමහන් පුවරුවල (බිල්බෝඩ්වල) පළ කළ යුතු තොරතුරු

දිනයඃ..............................

අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව/ ආයතනයඃ .................................................................................

ව්‍යාපෘතිය සිදුකරන ආයතනයඃ.........................................................................................................

- යෝජිත ව්‍යාපෘතිය පිළිබඳ විස්තරයඃ
- ව්‍යාපෘතියේ ස්ථානගත වීම (ව්‍යාපෘති ක්‍රියාකාරකම් සිදුකරන ස්ථානය පළාත,දිස්ත්‍රික්කය, කොට්ඨාසය, ස්ථානය වශයෙන් දක්වන්න. මායිම පැහැදිලිව සීමා නිර්ණය කළ නොහැකි නම් අතිරේක විස්තර සපයන්න.)
- ව්‍යාපෘතිය ආරම්භ වීමට යෝජිත දිනයඃ
- ව්‍යාපෘතිය අවසන් වීමට යෝජිත දිනයඃ
- ව්‍යාපෘතියේ අරමුණු/ඉලක්කඃ
- ව්‍යාපෘතියෙන් අපේක්ෂිත ප්‍රතිඵලය/වාසියඃ
- බලපෑමට පත් පාර්ශවයන්ට වන්දි ගෙවීමට/හානිපූරණය කිරීමට ගෙන ඇති පියවර පිළිබඳ සවිස්තරාත්මක විස්තරයක් ලබාදෙන්න. වන්දි ලබාගැනීම සඳහා අයදුම්කිරීමට අදාළ ආයතනික වගකීම සම්බන්ධ විස්තර ලබාදෙන්න.
- ව්‍යාපෘතියේ සම්පූර්ණ ඇස්තමේන්තුගත පිරිවැයඃ
- එකඟ වූ මිල ගණන් (මෙය, ගෙවීම සිදුකරන ව්‍යවහාර මුදල් ඒකකයෙන් මෙන්ම ශ්‍රී ලංකා රුපියල්වලින් ද දක්වන්න)
- මුදල් ලැබෙන මූලාශ්‍රය (විදේශ/දේශීය/වෙනත්-උදාහරණයක් වශයෙන් පොදු පෞද්ගලික හවුල්කාරිත්වය)-ව්‍යාපෘතිය සඳහා මුදල් යෙදවීමට සම්බන්ධ විදේශීය හෝ දේශීය ආස්ථිති/ආයතන හඳුනා ගන්න.
- ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන සැපයුම්කරු/විකිණීම්කරු/කොන්ත්‍රාත්කරු ගේ විස්තර සපයන්න.

යම්කිසි වැඩිදුර විමසීම් හෝ පැහැදිලිකර ගැනීම් අවශ්‍ය නම් .......................................................... ව්‍යාපෘතිය පිළිබඳ මහජනයාට විස්තර සැපයීම භාරව කටයුතු කරන නිලධාරියාගේ නිලය), දුරකථන අංකය/විද්‍යුත් ලිපිනය..........................................................................................................